දූවගෙ උනන්දුව

කතාව හා පින්තූර: බඩල්ගම, කෙහෙල්ඇල්ලේ
හර්මන් ආර්. සේනානායක ගෙනි.

ඇල්ල සුන්දර පිටිසර ගමකි. ගම මැදින් ගලන කුඩා ඔය ලැසි ගමණින් යන පිටිසර කෙල්ලක ගේ පිට දිග කඩා හැළුණු වරලස හා පුළුලුකුල ලෙලවා යන සුන්දර ගමනක් මතකයට නංවයි.

පැරණි මත අකුරටම පිළිපදින තවමත් පැරණි ලෝකයේ ජීවත්වෙන '' කුඩා ගෙදර '' අය ගමේ කවුරුත් දනී. පවුලේ හතර දෙනෙකි. අම්මා මැගි ය. තාත්තා රපියල් ය. මල්ලී අභය යි. රූබර කෙල්ල ලලිතා ය. නව යොවුන් වියේ පසු වන ඇය, අලුත් දේ සෙවීමටත් දැක බලා ගැනීමටත් ආසාවක් දක්වන්නීය.

'' මොන මළ උලව්වක් ද මන්ද ; උදේ ඉඳල රෑ වෙනකල් වැඩක් ඇත්තෙම නෑ. එක්කො පොතක් බලයි, නැත්නම් මොනව හරි ලියයි. අනේ හැබෑට මේකිට මොන වසංගතයක් හැදිලද මන්ද ? ඈ බොල, මොකද තිට වෙලා තියෙන්නේ, කියාපිය බලන්ට තියෙන දෙයක් '' මැගී කෝපයෙන් ඇසුවාය.

'' මොකුත් නෑ අම්මේ, මම මේ ඉල්ලුම් පත්‍රයක් පුරවනව. ''

'' මොනව ; ඉල්ලුම් පත්‍රයක් ! මොකද අපි උඹට කන්න නොසනෙ වද ? රස්සාවල් හොයන්නේ ? ගෑනුන්ට මොන රස්සාද බොල.හඹ ලමිස්සියක්, ගෙදර හිටපන්. ''

ඇල්ල සුන්දර ගම්මානයකි

" අනේ අම්මේ, රස්සාවකට යන්න නොවෙයි ඉල්ලුම් පත්‍රය. මම මේ ගමේ ගොවි සමිතියට බැඳෙන්න. "

" ගොවි සමිතියට බැඳෙන්න ? ඒත් එපා. එක එක නරි නාටක. අම්මප මේ ගැණුන් ගෙ සංවරේ නැතිවෙන වැඩ! ගං ඕක මෙහාට. " මැගී ඇය පුරවමින් සිටි ඉල්ලුම් පත්‍රය ඉරා පුළුස්සා දැම්මාය.

" දැන් මොනවා කරන්නද ? " ලලිතා කල්පනා කළාය.

පසුදා ලලිතා ඇගේ හිතවතියක් වන කුමාරි ගේ ගෙදර ගියා ය. ඇය ගොවි උපදේශිකාවක් ලෙස රජයෙන් ද පත්කර තිබුණා. ඇයට බාරව ඇත්තේ තරුණ ගොවි සමිතිවලට ගොස් ගොවියන්ටත්, ගෙවිලියන්ටත් පළතුරු කල් තබා ගන්නා අන්දම, කෝඩියල් සාදන අන්දම, සූප ශාස්ත්‍රය වැනි දේ කියා දීමයි. ඇය පෙරමගට ගොස් ලලිතා පිළිගත්තාය.

" මොකද ලලිතා කණගාටුවෙන් වගේ ? "

" නෑ කුමාරි අක්කේ, මම අපේ ගමේ ගොවි සමිතියට බැඳෙන්න ඉල්ලුම් පත්‍රයක් පුරවද්දී අම්මා ඒක ඉරල විසි කරලා මට බැන්නා. අනේ අක්කේ, මම හරි ආසයි සමිතියට බැඳෙන්න. ඒත් අම්මා ඒකට කැමති නෑ නොවැ. අනේ අක්කේ අම්මගේ කැමැත්ත අරන් දෙන්නකෝ. "

" හොඳයි හෙට පෝය නේ, මම උදේ දහයට විතර එහේ එන්නම්. "

පසුදා කුමාරි ලලිතාගේ ගෙදර ගියා ය.

" ආ.....කොහොමද පුංචි අම්මේ සැප සනීප ? "

" මොකද ලලිතා කණගාටුවෙන් වගේ "

" අනේ මන්ද. මොකද මෙහෙ එන්න හිතුනේ, උත්සවයකට ආධාර එකතු කරන්නද ? නැත්නම් සමාගමක් හදන්න අපිව එක්කාසු කරන්න ද ? මේ, නොකිව යි කියන්න එපා, ඒ ගැන මොකුත් කතා මෙහෙ බෑ. ගෑනුන්ට මොන සමාගම් ද ? ගෙවල් වල තියෙන නෙයියාඩගම් බලා ගත්තහම ඇති. ඇත්තට කුමාරි නෝනෝ, ඔහේ මේ කරන්නේ ගෑණු ජාතියට ඔබින වැඩද ? මහ නින්දවක් ! නෝන කොයි වෙලාවකවත් ගෙදර හරියේ නෑ. උදේ ඉඳල ගමනේ. ගෙදර එන්නේ රෑ. අර ගමෙයි, මේ ගමෙයි, අර සමාගමෙයි, මේ සමාගමෙයි, හැම තැනම ..... "

" ඒ මගේ රක්ෂාව නේ පුංචිඅම්මේ. ඔය පුංචිඅම්මා කරුණු නොදැන කරන කතාවක්. මොනව හරි කතා කරනකොට ඒ ගැන යමක් දැනගෙන කථා කරනව මිස නොදැන කථා කරන එක හොඳ නෑ. "

" මොනව ? මේ මට ද උගන්නන්න හදන්නේ ? අපි ඕවා ඉගෙනගෙන බොහොම කල්. "

" මේ මැගි නෝනෝ, උඹ ටිකක් කතාව නවත්තපන්, " එතැනට පැමිණි රපියෙල් මැගිට තර්ජනය කෙළේය.

"මේ මැගි නෝනෝ, උඹ ටිකක් කතාව නවත්තපන්"

"මොනවද බාප්පේ අපට ඕව ගණන් නෑ."

"හැබැටම කුමාරි නෝනා මොකද මෙහෙ ආවේ ?"

"බාප්ප දන්නව නේ ගමේ අර ගොවි සමිතිය ගැන."

"ඔව්, ඔව්, ඉතින්, ඉතින් ?"

"අන්න ඒකට මගේ කීමට ලලිතව බන්දන්න. හොඳ දේවල් ඉගෙන ගන්න තියෙනවා. කෑම, බීම, ජෑම්, ජල්ලි හදන්න උගන්වනව. ඇරත් අද රටේ ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙන ආහාර හිහය, හාල් හිහය මගහරවා ගන්න, ආණ්ඩුව උනන්දු වෙන මේ කාලේ, ඒ වැඩේ ට සමිතිත් උදව් දෙන්න එපායැ. ඉතින් ඒව කරන්ට බාප්පලට උදව් වෙන්න මේ ළමයටත් බැරියැ. ආණ්ඩුවට විතරක් බෑ නොවැ ඒක කරන්න. ඉතින් කෙනෙක් ඉපදිලා රටට වැඩක් නොකර නිකම්ම මැරිල යන එක වැඩක්යැ. ලලිතාටත් තනියම වුනත් පුළුවන් රටට සුළු වෙන් හරි සේවයක් කරන්න. ඒ උනාට ඊට වැඩිය හොඳ සමාගමකට බැඳිලා සේවයක් කරන එක. ඒ හින්ද මම කියන්නෙ ලලිතා නංගී ගොවි සමිතියකට බන්දන්න, මගේ කීම අහලා. මම වගකියනවා ලලිතා ගැන."

"අගේ ඇති අදහස ! මම කැමතියි. "මොන දේ වෙන්නෙත් යහපතට" කියල පැරණි කියමනකුත් තියනව නෙව. උඹට අම්මගෙ වගක් ඕනෑ නෑ කෙල්ලේ. උඹ බැඳියන් සමඟ ගමට."

"හෑ..... මොනව කීව ! ඔය සමාගමට අපේ ළමයව .....?"

"මේ මැගියෝ, උඹ පුප්පන්නේ නැතුව හිටින්. මම බලාගන්නම් ඒ හරිය."

ලලිතා දැන් ඇල්ල ගමේ පැරකුම් තරුණ ගොවි සමාජයේ සාමාජිකාවකි. ඇය ඉතාමත් දක්ෂ අන්දමින් හා ලැදියාවකින් වැඩෙහි යෙදුනාය. කෝඩියල් වැනි දේවල් හැදීමටත්, වී ගොවිතැනට අවශ්‍ය පොහොර යෙදීමටත්, ගොවි උපකරණ පාවිච්චි කිරීමටත් හැකියාවක් තරුණ ගොවි සමාජයෙන් දැන් ඇයට ලැබී ඇත. දිනක් ලලිතා තාත්තා සමඟ සමිතිය ගැන කතා බහ කළාය.



පැරකුම් තරුණ ගොවි සමාජයේ රැස්වීමක සාකච්ඡාවක්

" තාත්තේ, අපි මේ සැරේ වපුරමු අපේ කුඹුරු වල හොඳ අස්වැන්නක් දෙන එච්-4 වී ටිකක් ?"

" අනේ මන්ද ළමයෝ ඔව්වා කොහොම කැනෙද කියලා දැලුවා කෙරෙම කරන්න ගිහින් තියෙන ටිකක් නැතිවෙයි. "

' තාත්තේ අපි මේ සැරේ වපුරමු අපේ කුඹුරු වල හොඳ අස්වැන්නක් දෙන එච්-4 වී ටිකක්"

" නෑ තාත්තේ, එහෙම කියන්න එපා, අපට ගොවි සමිතියෙන්, ඕවර්සියර් මහත්වරුන් ගෙන්, ඉස්කෝලෙන් එහෙම උදව් ගන්න පුළුවනි. පෝරයි, හොඳ බිත්තර වීයි අඩු මිලට ආණ්ඩුවෙන් ගත්තැකි. "

" එහෙම නම් ළමයෝ, උඹට ඕනෑ විදිහකට කරපන්. මමත් පැත්තකින් ඉඳල උදව් වෙන්නම්. "

"තාත්තා ඔහොම කියනවා නම් මොනවා කරන්න බැරිද ? අම්මගෙන් තමා බේරෙන්න බැරි. "

ඇය තාත්තාට උදව් දෙමින් තම ප්‍රදේශයේ ඕවර්සියර් මහතා ගේ උපදෙස් පරිදි පොහොර යොදා වල් නෙළීම් කාලය පැමිණි විට ගමේ පාසැලේ ද සහාය ලබාගත්තාය. කෘමි නාශක බෙහෙත් යෙදුවාය. මේ අතර ඕවර්සියර් මහතා ගේ උපදෙස් අනුව තම ගම් ප්‍රදේශයේ පැවැත් වෙන වී ගොවිතැන් තරඟයට ද සහභාගි වූවාය.

වල් නෙළීමේ කාලය පැමිණි විට ගමේ පාසැලේ ද සහාය ලබාගත්තාය

ලලිතා තාත්තාත් සමඟ කිරි වඳින ගොයම දෙස ඉතිරි යන සොම්නසින් යුතුව බැලුවාය. අම්මට මේ කිසිවක් නුරුස්සයි.

කුඹුරේ අස්වැන්න පරීක්ෂා කිරීමට පැමිණි නිලධාරි පිරිස ඒවා ක්‍රමානුකූලව පරීක්ෂා කර නිති රිති අනුව මැන කිරා පොන් වල සටහන් යොදගෙන ගියහ.



නිලධාරි පිරිස අස්වැන්න පරීක්ෂා කළා

දිනෂ් රජියල් ට ' රාජ්‍ය සේවා ' ලිපියක් ලැබුණි.

" දුවේ මේ ලියමන කියවපන්, " ලලිතා ලිපිය කඩා බැලුවාය.

" තාත්තේ අපි වී ගොවිතැන් තරඟයෙන් පළමුවැනියට තේරිලා. ඉතින් මේ මාසේ 25 වැනිද ස්කෝලේ දී තෑගි දෙනවළු. උත්සවයකුත් තියෙනවළු. ඒකට සහභාගි වෙන්න කියල තියෙනවා. "

" ඈ.....දුවේ ! ..... " අම්මා යමක් කීමට සැරසුනාය.

" මේ..... මේ ..... නවත්වනවා, නවත්වනවා, දැන් එනව මෙතන පත් උත්තර අහන්න. "

" එපා තාත්තේ අම්මට මොකුත් කියන්න. අම්ම මේව ගැන දන්නවායැ. "

" හහ් ! දැන් නම් උඹට තේරෙනව නේද දුවගේ උනන්දුව. " තාත්තා කිවේ අම්මාට ඇනුම් පදයකි.

එද උත්සවය සඳහා කෘෂිකර්ම නිලධාරි මහත්වරු සහ පලාතේ මන්ත්‍රී තුමා පැමිණ සිටියෝය. මේ උත්සවයේ විශේෂ අමුත්තා වූ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තුමා පෙරහරින් කැඳවා ගෙන යන ලදී.

උත්සවයට නිලධාරි පිරිස පෙරහරින් කැඳවාගෙන යද්දී

මේ රැස්වීමේදී ඉතා ආදර්ශමත් හා රසවත් කතා අහන්ට ලැබුණි. රැස්වීමෙන් පසු ජයග්‍රාහක ගොවි මහතුන්ට තෑගි බෙදා දෙන ලදී. රජියල් ද තමාට හිමි තෑග්ග පිළිගත්තේ ඉතා ආඩම්බර යෙනි. මුළු ශාලාවම අත්පොළසන් හඬින් ගිගුම් දෙද්දී එද ඔහුට ලැබුණේ රුපියල් 500.00 යේ පළමු වැනි තෑග්ගයි. පත්තරකාරයෝ රජියල් ගොවි මහතාගේ පවුලේ සියලු දෙන එකට සිටුවා පින්තූර ගත්හ. ඔහුගෙන් නොයෙකුත් ප්‍රශ්න ද අසා සටහන් කර ගත්හ. රජියෙල් ඔවුන්ට කිවේ " දුවගෙ උනන්දුව " නිසා මේ තෑග්ග ලැබුණ බවයි.

(මනඃ කල්පිත කතාවකි.)